08
පාඩම

# නොඉවසීම විපතට මූල ය.

## ක්ෂාන්තිවාදී ජාතකය

ඉවසීම සෑම පුද්ගලයෙකු ම මැනවින් ප්‍රගුණ කළ යුතු ඉතා උසස් ගුණ ධර්මයකි. ඉවසීමේ සීමාව ඉක්මවා යාම නිසා ඇති වන අධික කෝපය හා ක්ෂණික කෝපය නිසා සමාජ ගැටලු බොහොමයක් හට ගනියි. මනුෂ්‍ය ඝාතන, සියදිවි නසා ගැනීම, පොදු දේපොල විනාශ කිරීම, කලකෝලාහාල හා රථවාහන අනතුරු යනාදී ව්‍යසනයන් බොහොමයකට ප්‍රධාන හේතුවක් වන්නේ ඒ ඒ පුද්ගලයන්ගේ ඉවසීමේ පවත්නා දුර්වලතාවන් ය.

අප මහා බෝසතාණන් වහන්සේ පිරූ දසපාරමිතා අතර ''ඛන්ති'' යනුවෙන් සඳහන් වන්නේ මෙම ඉවසීමේ ගුණාංගය යි. අප ජන සමාජය අතර ''ඉවසීමෙන් සැනසීම ලැබේ'' යන අගනා ප්‍රස්තා පිරුළක් ද ප්‍රකටව පවත්නේ එය බෙහෙවින් ම මිනිස් සමාජයේ යහපැවැත්ම සඳහා හේතුවන බැවිනි.

අප මහා බෝසතාණන් වහන්සේ ඉවසීම මැනවින් ප්‍රගුණ කළ ආකාරය දැක්වෙන ජාතක කතාවක් ලෙස ''ක්ෂාන්තිවාදී ජාතකය'' හඳුන්වා දිය හැකි ය.

## වර්තමාන කතාව

එකල බුදුරජාණන් වහන්සේ වැඩසිටියේ සැවැත්නුවර ජේතවනාරාමයේ ය. නිතර කෝප සහගතව හැසිරෙන භික්ෂූන් වහන්සේ නමක් පිළිබඳ එහි දී බුදුරදුන්ට දැන ගැනුමට ලැබුණි. එම භික්ෂුව කැඳවූ උන් වහන්සේ භික්ෂුවට අවවාද කරමින් ''පෙර උත්තමයෝ අත් පා කන් නාසා කැපීම ආදී ඉතා දරුණු වධ හිංසා කරද්දීත් කෝප නොවී සිටියාහු'' වේ යැයි වදාළ හ. පසුව භික්ෂූන් වහන්සේලා ගේ ආරාධනයෙන් ඉකුත් වත් ගෙනහැර දක්වා වදාළ සේක.

## අතීත කතාව

යටගිය දවස කසී රට කලාබු නම් රජ කෙනෙක් රාජ්‍යය කරන සමයෙහි අප මහා බෝසතාණන් වහන්සේ බමුණු කුලයක උපන්නා හ. උන්වහන්සේ නමින් ''කුරුණ්ඩක කුමරු'' යැයි ප්‍රකට විය. නිසි කල ශිල්ප ශාස්ත්‍ර මැනවින් හදාරා දෙමව්පියන්ගේ ඇවෑමෙන් ඔවුනගේ සියලු සම්පත්වලට උරුමකරු වූ කුරුණ්ඩක කුමරු පංච කාමයෙහි ආදීනව දැක එකී සියලු සම්පත් දාන විෂයෙහි විසුරුවා හැරියේ ය. පසුව ඍෂි ප්‍රව්‍රජ්‍යාව ලබා හිමාලය වනයෙහි වාසයට ගියේ ය. වරෙක ලුණු ඇඹුල් සේවනය සඳහා බරණැස් නුවරට පැමිණ රජ උයනෙහි නවාතැන් ගත්තේ ය. පසුදින තවුස්තුමා පිඬු පිණිස හැසිරෙණු

රජුගේ මහසෙනෙවි තෙමේ දුටුවේ ය. ඔහු ස්වකීය නිවසට තවුස්තුමා කැඳවාගෙන ගොස් දානමානාදිය පිරිනමා සංග්‍රහ කොට එම රාජ උයනෙහි ම වැඩ සිටීමට අවස්ථාව සලසා දුන්නේ ය.

මේ අතර එක් දිනක් කලාබු රජු දහසක් නාටක ස්ත්‍රීන් පිරිවරා උයන් කෙළියට ගිය හ. ඔවුනගේ නැටුම් ගැයුම් බලමින් ගිමන් වෙහෙස හරිමින් සිටින අතර බීමත්ව සිටි රජතුමා එක් කාන්තාවකගේ උකුලේ නින්දට වැටුණේ ය. ඒ දුටු සෙසු නාටක ස්ත්‍රීහු අප ගේ ස්වාමීන් නිදන කල අපි කාහට නැටුම්, ගැයුම්, වැයුම් කරමු දැයි, කතිකා කොට තූර්ය භාණ්ඩ එතැනම දමා උයන්සිරි නරඹන්නට වූ හ. එසේ ගමන් කරන අතර එක්තරා ගසක් මුල වැඩසිටින තාපසතුමා දුට හ. තාපසතුමා වටා රැස් වූ ඔවුහු බණක් දේශනා කරන ලෙස ඉල්ලා සිටිය හ. තවුසාණෝ බණ දෙසූ හ. තමා තනිකර ගොස් සෙසු පිරිස තවුස්තුමා සමීපයෙහි බණ අසනු දුටු ස්ත්‍රිය රජු අවදි කරවූවා ය. අවදි වී බලන විට සෙසු ස්ත්‍රී පිරිස නොදුටු රජු ඔවුන් කොහි ගියා දැයි, ඇයගෙන් විමසී ය. අසවල් තැන ගසක් යට තාපසතුමෙකු සමීපයෙහි ඔවුහු බණ අසති යි, ඇය පිළිතුරු දුන්නා ය.

එයින් රජු මහත් සේ කෝපයට පත් වී සැණෙකින් නැගී සිට කඩුව අමෝරා ගෙන තාපසතුමා මැරීමට වහා දිව ගියේ ය. නාටක ස්ත්‍රීහු වහා පැන කඩුව උදුරාගත් හ. ඉක්බිති රජු තාපසතුමාගෙන් ''තොප කිනම් වාදී දැ''යි ප්‍රශ්න කළේ ය. තාපසතුමාගේ පිළිතුර වූයේ ''මම ක්ෂාන්තිවාදී වෙමි'' යි යන්න ය. ක්ෂාන්තිය යනු කුමක් දැයි රජු විමසී ය. තමාට කෙනෙකු දොස් නගද්දී හිරිහැර කරද්දී නොකිපේ නම් එය ක්ෂාන්තිය බව තාපසතුමා කියා සිටියේ ය. තොප ළඟ ක්ෂාන්තියක් තිබේ දැයි බලන්නෙමි කියා රජු වධකයෙකු ගෙන්වා මෙම සොර තවුසා බිම හොවා කස පහර දෙව'යි අණ කළේ ය. වධකයාගේ කස පහරින් තුවාල ලත් තාපසතුමාගේ ඇඟෙන් ලේ ගලන්නට විය. රජු නැවතත් ''දැන් තොප කිනම් වාදී දැ''යි ඇසී ය. ''මහරජ, මම ක්ෂාන්තිවාදී වෙමි. මගේ ඉවසීම හද තුළ පවත්නා දෙයක් මිස ඇඟෙහි හෝ සමෙහි ඇති දෙයක් නොවේ'' යැයි, තාපසතුමා පිළිතුරු දුන්නේ ය. එයින් රජුගේ කෝපය තවත් දැඩිවිය.

ඉක්බිති රජු ''එසේ නම් ඔබගේ එම ක්ෂාන්තිය තවදුරටත් බලමි''යි, කියා තාපසතුමා ගේ දෙඅත්, දෙපා කැප්පවීය. දැන් තොප කිනම් වාදී දැයි රජු ඇසී ය. තාපසතුමාගේ පිළිතුර පෙරසේ ම විය. අනතුරුව රජු උන්වහන්සේගේ කන් නාසා කැපීමට නියම කළේ ය. එහි දී ද තාපසතුමා කියා සිටියේ රජු තමාට කෙතෙක් වධහිංසා කළත් ''මාගේ ක්ෂාන්තිය අත පය හෝ කන් නාසාවල පවත්නා දෙයක් නොව, එය මාගේ හද තුළ පවත්නා දෙයක්'' ය යනුවෙනි. වඩ වඩාත් කෝපයට පත් රජු ''එම්බල සොර තවුස, තොපගේ ක්ෂාන්තිය තොපගේ හද තුළ ම තබා ගනු යැ''යි, කියා විලුඹෙන් තාපතුමාගේ ළයට ඇන එතැනින් පිටත්ව ගියේ ය.

ඉක්බිති මහත් බියෙන් තැතිගත් සෙනෙවිතුමා තවුසා සමීපයට එළඹ ඇඟ ලේ පිසදමා කපා දැමූ අත්පාදිය නැවත එක්කොට වෙළුම්පටි දමා බැඳ පිළියම් කරවීය. අනතුරුව වැඳ වැටී ''මේ කළ අපරාධය රජු කළ දෙයක් මිස, තමාවත් රටවැසියන්වත් කළ දෙයක් නොවන හෙයින් අප කෙරෙහි නොකිපෙනු මැනවැ''යි, කියා සිටියේ ය. එය ඇසූ තාපසතුමා,

යො මෙ හත්‍ථෙ ච පාදෙ ච - කණ්ණ නාසං ච ඡේදයී
චිරං ජීවතු සො රාජා - න හි කුජ්ඣන්තිමාදිසා

''සෙනෙවිතුමනි, යම් රජ කෙනෙක් මාගේ අත් පා කණ් නාසා ද සිඳ වූයේ ද ඒ රජු බොහෝ කල් ජීවත් වේවා. ඔහු වැන්නෝ අනවබෝධයෙන් මට වධහිංසා කළත් මා සිත ඔහු කෙරෙහි කිසිදු වෛරයක් නොමැත. මා වැන්නෝ එබඳු වරදටත් නොකිපෙති' යි, වදාළහ. අනතුරුව උන්වහන්සේ සැමට මෙත් වඩා සුලු වේලාවකට පසු මිය පරලොව ගියේ ය. සෙනෙවිතුමා නුවරවැසියන් සමඟ එක්ව තාපසතුමාගේ ආදාහන කටයුතු කළේ ය. කලාබු රජුට එම අපරාධය කොට උයනින් පිටවන්නටවත් ඉඩක් නොලැබිණ. හෙතෙම පොළව පලාගෙන අවීචියට ගියේ ය.

එසමයෙහි කලාබු රජු නම් දැන් දේවදත්ත තෙරුන් ය. සෙනෙවිතුමා නම් සැරියුත් මහ රහතන් වහන්සේ ය. ක්ෂාන්තිවාදී තාපස වූයෙම් තිලෝගුරු බුදු වූ මම් ම වේ යැයි, ක්ෂාන්තිවාදී ජාතකය නිම කළ සේක.

**අභ්‍යාස**

01. ''ඉවසීම බෝසත් ගුණයකි'' ක්ෂාන්තිවාදී ජාතක කතාව ඇසුරෙන් මෙම අදහස පැහැදිලි කරන්න.
02. ඉවසීම නොමැතිකමින් සිදු වන පුද්ගල හා සමාජ ගැටලු 10 ක් ලියන්න.
03. ''ඉවසීමෙන් සැනසීම ලැබේ'' යන මාතෘකාව යටතේ රචනයක් ලියන්න.

**භාවිතයට**

අමිත ගුණ නුවණ යුතු උතුමෝ පබඳ
අනත වෙහෙස ලදුවත් නොම වෙති දුහද
දිගත පතළ සුවඳැති සොඳ සඳුන් කඳ
සිඳිත මඩිත එක ලෙස පැතිරෙයි සුවඳ
(සුභාෂිතය)